# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2224/8 - 2021 අප්‍රේල් මස 19 වැනි සඳුදා - 2021.04.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත**

**3 වැනි වගන්තිය යටතේ නියෝගය**

2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) උපවගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින් 2019 දෙසැම්බර් මස 05 දිනැති අංක 2152/32 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයෙහි* II වැනි උපලේඛනය, එකී උපලේඛනයට, මෙහි උපලේඛනයේ I හා II තීරුවල සඳහන් සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය සහ සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ ඊට අනුරූපව III වන තීරුවේ සඳහන් වූ විස්තර යටතේ නිශ්චිතව දක්වා ඇති අයිතමය එකතු කිරීමෙන් 2021 අප්‍රේල් 20 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් සංශෝධනය කරමි.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 අප්‍රේල් මස 19 වන දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| I<br>*සං. ව. ශීර්ෂය* | II<br>*සංයෝජිත වර්ගීකරණ සංකේතය* | III<br>*විස්තරය* | IV<br>*සහනදායී අනුපාතය* |
|---|---|---|---|
| 27.11 | | පෙට්‍රෝලියම් වායු සහ අනෙකුත් වායුමය හයිඩ්‍රොකාබන් | |
| | | ද්‍රවීකරණය කළ : | |
| | | අනෙකුත් : | |
| | 2711.19.10 | ද්‍රවීකරණය කළ පෙට්‍රෝලියම් වායු | ජාත්‍යන්තර ද්‍රවීකරණය කළ පෙට්‍රෝලියම් වායු මිල මෙට්‍රික් ටොන් එකකට ඇ. ඩො. 325 ට ළඟා වන තුරු, 7.5% හෝ මෙට්‍රික් ටොන් එකකට රු. 2000 යන දෙකෙන් වඩා අඩු අගය. |

05 - 60


1A - PG 5396 — 550 (2021/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*